1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/02/11/පොදු | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2023.01. 12 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන, මුදල්, ඉංජිනේරු සේවා, සැලසුම්),
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතු අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/SEC/01/09 හා 2022.12.05 දිනැති ලිපිය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL/6/2/29 හා 2022.12.27 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින්, වත්මන් ආර්ථික අභියෝග හමුවේ රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/22/1353/605/011 හා 2022.09.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සියලුම ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතු බවත්, එම අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දීමෙන් පසුව අවිධිමත් බඳවා ගැනීම්/ පත් කිරීම් හෝ උසස් කිරීම් සිදු කර ඇත්නම්, ඒ පිළිබඳව අදාළ කමිටුව වෙත දැනුම් දෙන ලෙසත් සඳහන් කර ඇත.

03. ඒ අනුව, එකී ලිපියේ සඳහන් උපදෙස් අනුව කටයුතු කරන ලෙසත්, ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව හෝ ඒ යටතේ පවතින සියලුම ආයතනවල ආයතන ප්‍රධානීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි. (එකී ලිපියේ පිටපතක් ඇමුණුම 01 හි දක්වා ඇත)

04. එමෙන්ම, උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දීමෙන් පසුව ඔබ යටතේ ක්‍රියාත්මක වන කිසියම් ආයතනයක එවැනි අවිධිමත් බඳවා ගැනීම්/ පත් කිරීම් හෝ උසස් කිරීම් සිදු කර ඇත්නම් ඒ පිළිබඳව දින තුනක් ඇතුළත මා වෙත දැනුම් දෙන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

සුමිත් අලහකෝන්,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

# අග්‍රාමාත්‍ය කාර්යාලය
## பிரதம அமைச்சரின் அலுவலகம்
## PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, சேர் எனஸ்ட் டி சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது இலக்கம் / My Ref. : PMO/SEC/01/09

ඔබේ යොමුව / உமது இலக்கம் / Your Ref. :

දිනය / திகதி / Date : 2022.12.05

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම**

වත්මන් ආර්ථික අභියෝග හමුවේ රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/22/1353/605/011 හා 2022.09.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය කෙරෙහි ඔබගේ කඩිනම් අවධානය යොමු කරනු රිසියෙමි.

උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය නොසලකා හරිමින්, රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා අවධිමත් පත්කිරීම් සිදුකෙරමින් පවතින බවට කමිටුව වෙත වාර්තා වී ඇති බැවින්, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ කමිටුවේ විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා විශේෂ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා බඳවා ගැනීම්/ පත්කිරීම් හෝ අභ්‍යන්තර උසස්කිරීම් යනාදිය සිදුවන්නේද යන්න පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වශයෙන් ඔබගේ පෞද්ගලික අවධානය මෙහෙයවීන් අගයමි.

ඒ අනුව, ඔබ අමාත්‍යාංශය යටතේ සියලුම ආයතන ප්‍රධානීන්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් අදාළ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව කටයුතු කළ යුතු බවට කඩිනමින්ම දැනුවත් කර, උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දීමෙන් පසුව ඔබ යටතේ ක්‍රියාත්මක කිසියම් ආයතනයක එවැනි අවිධිමත් බඳවා ගැනීම්/ පත්කිරීම්/ උසස්කිරීම් කිසිවක් සිදුකර ඇත්නම්, ඊට අදාළව ඔබ නිරීක්ෂණ සහිතව එම ක්‍රියාදාමයන් නැවත සමාලෝචනයකට ලක් කිරීම සඳහා වහාම කමිටුව වෙත දැනුම් දෙන ලෙස කාරුණිකව දන්වමි.

අනුර දිසානායක
අග්‍රාමාත්‍ය ලේකම් හා
සභාපති, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය
කිරීමේ අමාත්‍ය මණ්ඩල නිලධාරී කමිටුව

දුරකථන අංකය : +94 11- 2575311 ෆැක්ස් අංකය : +94 11- 2575310
විද්‍යුත් ලිපිනය : secpm@pmoffice.gov.lk

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. විගණකාධිපති
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
6. අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය
8. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
9. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව